මධ්‍යම පළාත් සභාව
மத்திய மாகாண சபை
CENTRAL PROVINCIAL COUNCIL

මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන

මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන ,මිනිස් බල, දෙමළ අධ්‍යාපන හා මුස්ලිම් පාසල් කටයුතු, සංස්කෘතික කටයුතු, ඉඩම්, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු, සංචාරක, ක්‍රීඩා සහ ආයෝජන සම්බන්ධීකරණ, වෙනත් අමාත්‍යාංශයන් යටතට නොගැනෙන විෂයයන් සම්බන්ධ අමාත්‍යාංශය

மத்திய மாகாண பிரதான மற்றும் கல்வி

நிதியும் திட்டமிடலும், சட்டமும் ஒழுங்கும், உள்ளூராட்சி மற்றும் மாகாண நிர்வாகம், மனித வலு, தமிழ் கல்வி மற்றும் முஸ்லிம் பாடசாலை நடவடிக்கைகள், கலாசார விவகாரங்களும், காணி, வர்த்தகமும் வாணிபமும், உணவு விநியோகமும் பகிர்ந்தளிப்பும், சுற்றுலா, விளையாட்டு மற்றும், முதலீடு தொடர்பிணைப்பு, ஏனைய அமைச்சுக்களுக்கு கீழ் சேர்த்துக் கொள்ளப்படாத விடயங்கள் தொடர்பான அமைச்சு

Central Provincial Chief And Education

Ministry of Finance and Planing, Law and order, Local Government and Provincial Administration, Man Power, Tamil Education and Muslim Schools Activities, Culture Affairs, Land, Trade and Commerce, Food Supplies and Distribution, Tourism, Sports and Investment Coordination Portfolios which are not taken under any other Ministries

පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
மாகாண சபைக் கட்டத் தொகுதி, பல்லேகலை, குண்டசாலை.
Provincial Council Complex, Pallekele, Kundasale.

විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail : pcmcentral@gmail.com
වෙබ් අඩවිය / இணையம் / Website : www cpem.lk

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ කාර්යාලය<br>அமைச்சு அலுவலகம்<br>Ministry Office | 081-4481322 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2424938 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>சிரேஷ்ட உதவி செயலாளர்<br>Senior Assistant Secretary | 081-2424936 | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | 081-2424935 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 0812424938 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No | සිපිසි/සිඑමඑස්/1/29/1/13-1/2024 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.09. 24 |

මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින්,
මධ්‍යම පළාතේ සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගම්පොළ සහ විල්ගමුව අධ්‍යාපන කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම</u>**

මේ වන විට පුරප්පාඩුව පවතින ගම්පොළ සහ විල්ගමුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු විධිමත්ව පත්කළ යුතුව ඇති බැවින්, එම තනතුරට සියලුම පළාත්වල ආයතනයන්හි සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව, දැනට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරක සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු ඉල්ලුම් කරන්නේ නම්, අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට ඔහු/ඇය දැනට සේවයේ නියුතු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත්ව එම තනතුරේ අවම වශයෙන් වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

03. මේ සමග අමුණා ඇති නිවේදනය ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති ජාතික පාසල් ඇතුළු පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ද දැනුවත් කර, ඔවුන්ගේ අයදුම්පත් 2024.10.08 දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එච්.එම්. එම්.යූ.බී.හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

පිටපත්-

| | | |
|---|---|---|
| 1. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය | - කා.දැ.ගැ.ස. |
| 2. | ප්‍රධාන ලේකම්, මධ්‍යම පළාත | - කා.දැ.ගැ.ස. |
| 3. | ආණ්ඩුකාර ලේකම්, මධ්‍යම පළාත | - කා.දැ.ගැ.ස. |
| 4. | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මධ්‍යම පළාත | - කා.දැ.ගැ.ස. |

CamScanner

### නිවේදනයයි
### මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගම්පොළ සහ විල්ගමුව අධ්‍යාපන කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගම්පොළ සහ විල්ගමුව අධ්‍යාපන කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම්:-

01. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුයි.

02. ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සඳහන් I වන හෝ II වන උපලේඛනය යටතේ සිදුකරනු ලැබූ පූර්වාසන්න වසර 5ක වරදකට දඬුවම් නොලැබූ අයෙකු හෝ කිසිදු ආකාරයක විනය කටයුත්තක් පවතින හෝ එවැනි කටයුත්තකට භාජනය වීමට නියමිත අයෙකු හෝ නොවිය යුතුයි.

03. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 05ක් තුළ නියමිත පරිදි වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර, සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි.

04. අයදුම්පත් කැඳවන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන ඉහත සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

05. මධ්‍යම පළාතේ දැනට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරක සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු ඉල්ලුම් කරන්නේ නම්, අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට ඔහු/ඇය දැනට සේවයේ නියුතු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත්ව එම තනතුරේ අවම වශයෙන් වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**සටහන :-**

සුදුසුකම් සනාථ කෙරෙන සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකවල සහතික කල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුයි.

**තෝරා ගැනීමේ ක්‍රමය :-**

මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම මගිනි (අදාළ ලකුණු ලබා දීමේ පටිපාටිය ඇමුණුම 02 ලෙස ඇතුළත් කර ඇත).

**අයදුම්පත් ඉදිරිපත් කිරීම :-**

අයදුම්පත් **www.cmcp.gov.lk** යන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් ලබාගත හැක. සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2024.10.08 දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව සකස් කර **"ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ."** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගම්පොළ සහ විල්ගමුව අධ්‍යාපන කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම."** යනුවෙන් සඳහන් කළ යුතුයි. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය භාරගනු නොලැබේ.

එච්.එම්. එම්.යූ.බී.හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

CamScanner